# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1792/24 – 2013 ජනවාරි 10 වැනි බ්‍රහස්පතින්දා – 2013.01.10

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2013 අංක 04 දරන ආඥාව**

මගේ යොමු අංකය: 4-3/9/2012/අයිආර්/253.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: බීඩී/එස්ටී/එල්එන්ඩී/1/ඒසීම්යූඅයි/91.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

2013 ජනවාරි මස 04 වැනි දින,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
'මිහිකත මැදුර'
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියා.**– ප්‍රාදේශීය ලේකම්, සොරණාතොට.

2. **ඉඩමේ විස්තරය.**– ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ සොරණාතොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කුට්ටියගොල්ල (25ඒ) ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, පහළ කොබෝවත්ත ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක B/ACQ/SRN/2012/454 හා 2012.10.30 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සඳහන් ප්‍රමාණයෙන් හෙක්. 1.6211 ක් පමණ වන පහළ කොබෝවත්ත නැමති පහත සඳහන් ඉඩම් කැබලි 5 ට මායිම්:

01. **කැබලි අක්ෂර 'ඒ' – පහළ කොබෝවත්ත – ප්‍රමාණය: හෙක්. 0.0454 ක් පමණ**

උතුරට: බලංගොඩ වැවිලි සමාගම හිමිකම් කියන පහළ කොබෝවත්ත සහ වතු පාර; නැගෙනහිරට: වතු පාර; දකුණට: කැබලි අක්ෂර බී; බටහිරට: කැබලි අක්ෂර බී සහ බලංගොඩ වැවිලි සමාගම හිමිකම් කියන පහළ කොබෝවත්ත.

02. **කැබලි අක්ෂර 'බී' – පහළ කොබෝවත්ත – ප්‍රමාණය: හෙක්. 0.2180 ක් පමණ**

උතුරට: බලංගොඩ වැවිලි සමාගම හිමිකම් කියන පහළ කොබෝවත්ත, කැබලි අක්ෂර ඒ සහ වතු පාර; නැගෙනහිරට: කැබලි අක්ෂර ඒ, වතු පාර සහ බලංගොඩ වැවිලි සමාගම හිමිකම් කියන පහළ කොබෝවත්ත; දකුණට: වතු පාර, බලංගොඩ වැවිලි සමාගම හිමිකම් කියන පහළ කොබෝවත්ත සහ කැබලි අක්ෂර සී; බටහිරට: කැබලි අක්ෂර සී සහ බලංගොඩ වැවිලි සමාගම හිමිකම් කියන පහළ කොබෝවත්ත.

03. **කැබලි අක්ෂර 'ඩී' – පහළ කොබෝවත්ත – ප්‍රමාණය: හෙක්. 0.9734 ක් පමණ**

උතුරට: බලංගොඩ වැවිලි සමාගම හිමිකම් කියන පහළ කොබෝවත්ත, කැබලි අක්ෂර සී, කැබලි අක්ෂර එච් සහ කැබලි අක්ෂර ජී; නැගෙනහිරට: කැබලි අක්ෂර සී, කැබලි අක්ෂර එච්, කැබලි අක්ෂර ජී සහ බලංගොඩ වැවිලි සමාගම හිමිකම් කියන පහළ කොබෝවත්ත; දකුණට: කැබලි අක්ෂර එච්, කැබලි අක්ෂර ජී, බලංගොඩ වැවිලි සමාගම හිමිකම් කියන පහළ කොබෝවත්ත, කැබලි අක්ෂර එෆ් සහ ඊ; බටහිරට: බලංගොඩ වැවිලි සමාගම හිමිකම් කියන පහළ කොබෝවත්ත, කැබලි අක්ෂර එෆ් සහ ඊ.

04. **කැබලි අක්ෂර 'ඊ' – පහළ කොබෝවත්ත – ප්‍රමාණය: හෙක්. 0.1808 ක් පමණ**

උතුරට: බලංගොඩ වැවිලි සමාගම හිමිකම් කියන පහළ කොබෝවත්ත සහ කැබලි අක්ෂර ඩී; නැගෙනහිරට: කැබලි අක්ෂර ඩී; දකුණට: කැබලි අක්ෂර ඩී සහ බලංගොඩ වැවිලි සමාගම හිමිකම් කියන පහළ කොබෝවත්ත; බටහිරට: බලංගොඩ වැවිලි සමාගම හිමිකම් කියන පහළ කොබෝවත්ත.

05. **කැබලි අක්ෂර 'එච්' – පහළ කොබෝවත්ත – ප්‍රමාණය: හෙක්. 0.2035 ක් පමණ**

උතුරට: කැබලි අක්ෂර ඩී සහ සී; නැගෙනහිරට: කැබලි අක්ෂර සී සහ බලංගොඩ වැවිලි සමාගම හිමිකම් කියන පහළ කොබෝවත්ත; දකුණට: බලංගොඩ වැවිලි සමාගම හිමිකම් කියන පහළ කොබෝවත්ත, කැබලි අක්ෂර ජී සහ ඩී; බටහිරට: කැබලි අක්ෂර ජී සහ ඩී.

01 - 683

---

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

### 39අ(1) වැනි වගන්තිය යටතේ නියමය

1973 නොවැම්බර් මස 16 වැනි දින අංක 86 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයෙහි* පළ කරන ලද 1973 අංක 983 හා 1973.11.06 වැනි දින දරන (460 වැනි අධිකාරය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාවෙන් මෙහි පහත I වැනි උපලේඛනයෙහි සඳහන් ඉඩම් කොටස් රජය වෙත සම්පූර්ණයෙන් සතු වී ඇති අතර, රජය සඳහා සහ ඒ වෙනුවෙන් එකී පනතේ 40 වැනි වගන්තියෙහි (අ) ඡේදය යටතේ එම කොටසේ සන්තකය ද ලබාගෙන තිබේ. එහෙත් එම පනතේ (1979 අංක 8 දරන පනතින් ඇතුළත් කරන ලද) 39(අ) වැනි වගන්තියේ 1 වැනි උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම, එකී ඉඩම් මෙම නියමය මගින් අවසතු කරමි.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

මගේ යොමු අංකය: 03/ජේ/72/එල්/ 219/වීඊ.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: උප/03/ඉඅත්/එල්ඩී/එෆ්/578..
2013 ජනවාරි මස 04 වැනි දින,
"මිහිකත මැදුර",
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
අංක 1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

### I වැනි උපලේඛනය

මහනුවර දිස්ත්‍රික්කයේ, දොළුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කඳුකර පහළ කෝරළේ, මුල්ගම ගමේ පිහිටි, මැනුම් අධිකාරීගේ අංක මහ 73/ 74 දරන ප්‍රගමන අනුරේඛනයේ සඳහන් ලෙව්ලන් වතුයායේ, ගලපිටපතන කොටසින් අක්කර 13, රූඩ් 01, පර්. 00 ක් පමණ වන පහත සඳහන් මායිම් තුල වූ ඉඩම් කොටස:

01. **ගලපිටපතන ඉඩම – ප්‍රමාණය: අක්. 13, රූඩ් 01, පර්. 00 ක් පමණ**

උතුරට: පිටවල ඔය සහ ඇළ; නැගෙනහිරට: එම ඉඩමේ ඉතිරි කොටස සහ වතු පාර; දකුණට: එම ඉඩමේ ඉතිරි කොටස, වතුපාර සහ අඩි පාර; බටහිරට: රජය සතු ගලපිටපතන මූකලාන, පී. ජී. කරුණාරත්න සහ තවත් අය හිමිකම් කියන දෝවහේන වත්ත සහ ඩී. එච්. වෙත්තසිංහ අප්පුහාමි හිමිකම් කියන දෝවහේන.

01 - 684

---

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

### 39අ(1) වැනි වගන්තිය යටතේ නියමය

1991 ඔක්තෝම්බර් මස 23 වැනි දින අංක 685/ 6 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයෙහි* (460 වන අධිකාරය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ පලකරන ලද 1991 අංක 144 දරන ආඥාවේ සඳහන් ඉඩම් කොටස් රජය වෙත සම්පූර්ණයෙන් ම සතු වී ඇති අතර, රජය සඳහා සහ ඒ වෙනුවෙන් එකී පනතේ 40 වැනි වගන්තියෙහි (අ) ඡේදය යටතේ එම ඉඩම් කොටස්වල සන්තකය ද ලබාගෙන තිබේ. එහෙත් එම පනතේ (1979 අංක 8 දරන පනතින් ඇතුළත් කරන ලද) 39අ(1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම, එකී ඉඩම් කොටස් අතුරින් මෙහි පහත 1 වන උපලේඛනයෙහි සඳහන් ඉඩම් කොටස පමණක් මෙම නියමය මගින් අවසතු කරමි.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

මගේ යොමු අංකය: එල්/03/ජේ/91/එල්ආර්බී/ 91-(11 වෙළුම).
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: ජීසීඑෆ්/අත්/එන්ජී/8/එල්ආර්.
2013 ජනවාරි මස 04 වැනි දින,
"මිහිකත මැදුර",
ඉඩම්, ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
අංක 1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

### I වන උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ (කොට්ඨාශ අංක 4, නාවල ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභා සීමාව තුල) නාවල ගමේ පිහිටි මැනුම්පති විසින් 1991.01.04 දින පිළියෙල කර නැවත 2012.10.23 දින සංශෝධනය කර පිළියෙල කරන ලද මු.පි.කො. 7948 දරන මූලික පිඹුරේ කැබලි අංක 29 වශයෙන් පෙන්නුම් කරන ලද ප්‍රමාණයෙන් හෙක්. 0.0760 ක් පමණ වූ පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණයන්ගෙන් යුත් බිම් කොටසට මායිම්:

01. **කැබලි අංක 29 - ගොරකගහකුඹුර – ප්‍රමාණය: හෙක්. 0.0760**

උතුරට: මෙම පිඹුරේ කැබලි අංක 2; නැගෙනහිරට: මෙම පිඹුරේ කැබලි අංක 30; දකුණට: මෙම පිඹුරේ කැබලි අංක 30 සහ 19; බටහිරට: මෙම පිඹුරේ කැබලි අංක 25.

01 - 685